# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 17 දරන
# පරිපාලන කටයුතු පිළිබඳ
# පාර්ලිමේන්තු කොමසාරිස්
# පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


1981 මාර්තු මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 1.30 යි

තැපැල් ගාස්තුව : ශත 75 යි

# කොමසාරිස් පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 12 වන දින]

එල්.ඩී.—ඕ. 86/79.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව ප්‍රකාර පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ධුරය සංස්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් ඔහුගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නිර්ණය කිරීම පිණිස හා ඒ හා සම්බන්ධ වූ හෝ ඊට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසත් වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් නියම කරනු ලබන දිනයක ක්‍රියාත්මක වන්නේ ය. — *සංක්ෂිප්ත නාමය හා ක්‍රියාත්මක වන දිනය.*

## I වන කොටස

### ඔම්බුඩ්ස්මන්වරයා

**2.** (මෙහි මින් මතු "ඔම්බුඩ්ස්මන්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයෙක් වන්නේ ය. — *පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් ධුරය සංස්ථාපනය කිරීම.*

**3.** (1) ඔම්බුඩ්ස්මන්වරයා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු අතර, ඔහු යථා පැවැත්මෙන් සිටිනතාක් තම ධුරය දරන්නේ ය. — *පත්කිරීම හා ධුර කාලය.*

(2) ඔම්බුඩ්ස්මන්වරයා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පාර්ලිමේන්තුවේ නිලධරයකු හෝ යම් රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක හෝ සාමාජිකයකු හෝ නිලධරයකු නොවිය යුතු ය.

(3) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, ජනාධිපතිවරයාගේ ලිඛිත අනුමතය ඇතිව මිස, (වැටුප් ගෙවනු ලබන හෝ නොගෙවනු ලබන) වෙනත් යම් ධුරයක් දැරීම නැතහොත් තම ධුරයේ කාර්යවලට බාහිරව, ලාභ හෝ පඩිනඩි ලබන්නා වූ යම් තනතුරක් භාර ගැනීම හෝ ගෙවීමක් ලබන යම් රැකියාවක නිරත වීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(4) ඔම්බුඩ්ස්මන්වරයාගේ වැටුප පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය යුතු අතර, එය ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය. තව ද, ඔහුගේ ධුර කාලය තුළ එම වැටුප අඩු නොකරනු ලැබිය යුතු ය.

(5) ඔම්බුඩ්ස්මන්වරයා—

(අ) මියගිය හොත්, එවිට ;

(ආ) ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ඉල්ලා අස් වූව හොත්, එවිට ;

(ඇ) වයස අවුරුදු හැට අට සම්පූර්ණ කළ විට ;

(ඈ) රෝගාතුර වීම නිසා හෝ ශාරීරික නැතහොත් මානසික දුබල තාවයක් නිසා හෝ ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුවහොත්, එවිට ; හෝ

(ඉ) පාර්ලිමේන්තුව විසින් සම්මත කොට ඉදිරිපත් කරන යෝජ නාවක් අනුව ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබුව හොත්, එවිට

ඔම්බුඩ්ස්මන් ධුරය හිස් වන්නේ ය.

(6) ඔම්බුඩ්ස්මන්වරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වේ නම්, ඒ කාල සීමාව සඳහා ඔම්බුඩ්ස්මන් ධුරයේ වැඩ බැලීම පිණිස වෙනත් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය හැක්කේ ය. එසේ වැඩ බලන කාලය තුළ දී ඒ තැනැත්තා ඔම්බුඩ්ස් මන්වරයා වූවාක් ම සේ සලකා ඔහුට සෑම ආකාරයකින් ම මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයා සතු සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය හිමිවිය යුතු අතර, ඔහු විසින් එම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීම ද කළ හැකි වන්නේ ය.

(7) ශ්‍රේෂ්ඨාධිකරණයේ හෝ අභියාචනාධිකරණයේ විනිශ්චය කාරවරයකු ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුවේ යෝජනාවක් ඉදිරි පත් කොට සම්මත කර ගැනීමේ කාර්ය පටිපාටිය, ඔම්බුඩ්ස්මන්වරයා ඉවත් කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් යෝජනාවක් ඉදිරිපත් කොට සම්මත කර ගැනීම කෙරෙහි සියළු ආකාරයෙන් ම අදාළ විය යුතු ය.

රජයේ නිලධරයකු ඔම්බුඩ්ස්මන්වරයා වශයෙන් පත් කළ විට.

4. ඔම්බුඩ්ස්මන්වරයා වශයෙන් තමා පත්කරනු ලැබීමට පූර්ව යෙන් ම රජයේ නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම, ඔම්බුඩ්ස් මන් ධුරයේ පත්වීම ක්‍රියාත්මක වන විට, ඔහු ඒ ධුරය අත්හැරිය යුතු ය :

එසේ වුව ද,—

(අ) ඔහු, ඒ රජයේ සේවකයා වශයෙන් තමා සතුව පවතින්නා වූ ද තමාට උපචිත වෙමින් ඇත්තා වූ ද අයිතිවාසිකම් එලෙසම තබා ගන්නේ ය ;

(ආ) ඒ අයිතිවාසිකම් නිශ්චය කිරීම සඳහා, මේ පනත යටතේ ඔහුගේ සේවය රජයේ සේවයෙහි සේවය ලෙස සලකා ගණන් ගනු ලැබිය යුතු වන්නේ ය.

නිල ප්‍රතිඥාව හෝ දිවුරුම.

5. ඔම්බුඩ්ස්මන් ධුරයට පත් කරනු ලබන තැනැත්තකු, ජනාධිපතිවරයා ඉදිරිපිට දී, උපලේඛනයේ දක්වා ඇති ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ස්වකීය ධුරයේ කාර්යයන්හි නොයෙදිය යුත්තේ ය.

රහස්‍යතාව රැකීමේ යුතුකම.

6. (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින් ධුරය දරන අතර සහ ධුරය දැරීම තමා විසින් අවසන් කරනු ලැබීමෙන් පසු, තමාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී තමාට දැනගැනීමට ලැබෙන සෑම කරුණක් සම්බන්ධයෙන් ම, මේ පනත යටතේ කරනු ලැබීමට නියමිත යම් පරීක්ෂණයක කාර්ය සඳහා සහ යම් වාර්තාවක හෝ නිර්දේශ කිරීමක කාර්ය සඳහා හැර, රහස්‍යතාව රකිනු ලැබිය යුතු ය.

(2) ඔම්බුඩ්ස්මන්වරයා විසින් මේ පනත යටතේ තමාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමා වෙත ලැබෙන්නා වූ හෝ තමාට දැනගැනීමට ලැබෙන්නා වූ හෝ යම් තොරතුරක්, මෙම පනත බලාත්මක කිරීමේ කාර්ය සඳහා හැර, තමා විසින් හෙළි නොකරනු ලබන බවට ඔම්බුඩ්ස්මන්වරයා විසින් ජනාධිපතිවරයා ඉදිරිපිට ප්‍රතිඥාවක් දී ඊට අත්සන් තබන තෙක් හෝ දිවුරුම දී ඊට අත්සන් තබන තෙක් හෝ ස්වකීය ධුරයේ කාර්යයන්හි නිරත නොවිය යුතු ය.

ඔම්බුඩ්ස්මන්වරයා ධුරය දැරීම අවසන් කිරීමෙන් පසු, අනුමතය නොමැතිව, රජයේ ධුරයක් නොදැරිය යුතු බව.

7. ඔම්බුඩ්ස්මන් ධුරය දරනු ලැබ ඇති කිසිම තැනැත්තකු විසින් කවර අවස්ථාවක දී වත්, ජනාධිපතිවරයාගේ ලිඛිත අනුමතය නොමැතිව, රජයේ නිලධරයකු වශයෙන් ධුරය නොදැරිය යුතු ය.

## II වන කොටස

### ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්ය මණ්ඩලය

නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයා.

8. (1) ජනාධිපතිවරයා විසින් කලින් කල, ඔම්බුඩ්ස්මන්වරයා විමසා, එක් නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙකු හෝ ඊට වැඩි ගණනක් හෝ පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, මේ පනත යටතේ තමා සතු බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින්, මේ වගන්තිය යටතේ පැවරීමේ බලය සහ මේ පනතේ 18 වන වගන්තිය යටතේ වාර්තාවක් සැපයීමේ බලය හැර, යම් විශේෂ කාරණයක් හෝ කාරණා පන්තියක් හෝ වර්ගයක් හෝ සම්බන්ධයෙන් වූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක්, තම අත්සන සහිත ලියවිල්ලක් මගින්, එම ලියවිල්ලේ සඳහන් පරිසීමාවන්ට සහ කොන්දේසිවලට යටත්ව, නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයකුට පවරනු ලැබිය හැකි ය. ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඒ පැවරීම ඕනෑම අවස්ථාවක ප්‍රත්‍යාදිෂ්ට කිරීම, වෙනස් කිරීම හෝ අන්‍යාකාරයකින් සංශෝධනය කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(3) නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයකු වෙත පවරනු ලබන, යම් කරුණක් සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයා සතු සියලු ම බලතල, කාර්ය හා කර්තව්‍ය, පැවරීමේ සාධන පත්‍රයෙහි ඇතුළත් යම් පරිසීමාවකට හා කොන්දේසියකට යටත්ව, නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයා විසින් ක්‍රියාත්මක කිරීම ද ඉටු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක්, පවරනු ලැබ ඇති අවස්ථාවක, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඒ බලය, කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකිරීම, එවැනි පැවරීමක් කරනු ලැබ තිබුණ ද, කරනු ලැබිය හැකි ය.

(5) නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයකු වෙත ඔම්බුඩ්ස්මන්වරයා විසින් පවරා දෙනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම, ඒ ඔම්බුඩ්ස්මන්වරයා ධුරය අත්හැර ගිය ද එය නොතකා ඒ පැවරීම ඒ ඔම්බුඩ්ස්මන්වරයාගේ ධුරයට පත්වන යම් අනුප්‍රාප්තිකයකු විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක්, වෙනස් කරනු ලබන තෙක් හෝ අන්‍යාකාරයකින් සංශෝධනය කරනු ලබන තෙක් හෝ ඒ නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයා විසින් දිගටම කර ගෙන යනු ලැබිය හැකි ය.

(6) 3 වන, 4 වන, 5 වන, 6 වන සහ 7 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයකු කෙරෙහි හා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය :

එසේ වුව ද, නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙක් වයස අවුරුදු හැට පහ සම්පූර්ණ කළ විට සිය ධුරය අත්හරින්නේ ය.

අනිකුත් කාර්ය මණ්ඩලය.

**9.** (1) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයාගේ සහ නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි ලා හා ඉටු කිරීමෙහි ලා ඔම්බුඩ්ස්මන්වරයාට හා නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයාට ආධාර දීමට හා සහාය වීමට අවශ්‍ය නිලධරයන් හා සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන සියලු නිලධරයන්ට සහ සේවකයන්ට 5 වන හා 6 වන වගන්තිවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය :

එසේ වුව ද, ඒ නිලධරයන් විසින් හා සේවකයන් විසින් ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරිපිට 6 වන වගන්තියෙහි සඳහන් ප්‍රතිඥාව දී ඊට අත්යන් තැබීම හෝ දිවුරුම දී ඊට අත්සන් තැබීම හෝ කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයා වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය අතුරින්, 8 වන වගන්තිය යටතේ වූ පැවරීමේ බලය, 18 වන වගන්තිය යටතේ යම් වාර්තාවක් කිරීමේ බලය හා 20 වන වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කිරීමේ බලය හැර, යම්

බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට, මේ වගන්තිය යටතේ පත් කරනු ලබන යම් නිලධරයකුට ඔම්බුඩ්ස්මන්වරයා සුදුසු යයි සලකන පරිසීමාකිරීම්වලට හෝ කොන්දේසිවලට යටත් ව, බලයදීම ඔම්බුඩ්ස්මන්වරයා විසින් ලියවිල්ලකින් වූ සාධන පත්‍රයක් මගින් කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් සාධන පත්‍රයක් ප්‍රකාර ඔම්බුඩ්ස්මන්වරයාගේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කරතැයි හෝ ඉටු කරනු ලැබෙතැයි සලකනු ලබන යම් තැනැත්තකු විසින්, ඒ බලය හෝ කාර්යය හෝ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට ඔහු සතු අධිකාරිය පිළිබඳ සාක්ෂිය ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කරනු ලැබූ විටෙක ඔහු විසින් ඒ සාධන පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## III වන කොටස

## ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල, කාර්ය හා කර්තව්‍ය

ඔම්බුඩ්ස්මන්වරයාගේ කර්තව්‍ය.

10. (1) (මෙහි මින් මතු "මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සලකා බැලීම පිණිස පිහිටුවනු ලැබ ඇති පාර්ලිමේන්තුවේ කාරක සභාව වෙත පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විසින් ඉදිරිපත් කරනු ලබන යම් පෙත්සමකින්, රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයකු විසින් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කරනු ලැබ ඇති බව හෝ වෙනත් අයුක්තියක් සිදු කරනු ලැබ ඇති බව හෝ අනාවරණය වන බව ඒ කාරක සභාවේ අදහස වන අවස්ථාවක, පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා ඒ පෙත්සම ඒ කාරක සභාව විසින්, ඔම්බුඩ්ස්මන්වරයා වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) යම් තීරණයක්, නිර්දේශයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් යම් අධිකරණයක දී හෝ වෙනත් විනිශ්චයාධිකාරයකදී හෝ රිට් ආඥාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ප්‍රශ්න නොකළ යුතු ය යනුවෙන් වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සලසා ඇත ද ඔම්බුඩ්ස්මන්වරයා විසින් මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ වූ යම් කරුණක් සම්බන්ධයෙන් පරීක්ෂා කොට වාර්තා කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තියෙහි, "යම් අයුක්තියක්" යන්නට යම් තීරණයකින් හෝ (අමාත්‍යවරයකු වෙත කරනු ලබන නිර්දේශයක් ඇතුළුව) නිර්දේශයකින් හෝ යම් ක්‍රියාවකින් හෝ නොකර හැරීමකින් සිදු කරනු ලැබ ඇතැයි කියනු ලබන හෝ සිදු කරනු ලැබීමට ඉඩ ඇතැයි කියනු ලබන හෝ යම් අයුක්තියක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් පිළිගනු ලැබ ඇති යම් අයිතිවාසිකමක් කඩ කිරීමක් හෝ ඇතුළත් වන්නේ ය.

පරීක්ෂා කිරීමට යටත් නොවන කරුණු.

**11.** පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් පරීක්ෂා කිරීමට හෝ වාර්තා කිරීමට මේ පනතෙහි කිසිවකින් ඔම්බුඩ්ස්මන්වරයා හට බලය නො පැවරෙන්නේ ය :—

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරම්භ වීමට පෙර සිදුවීයයි කියනු ලබන මූලික අයිතිවාසිකමක් කඩ කිරීම හෝ වෙනත් අයුක්තියක් පිළිබඳ යම් පැමිණිල්ලක් හෝ චෝදනාවක් ;

(ආ) (i) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ වූ හෝ මහජන ආරක්ෂාවට අදාළව තත් කාලයෙහි බලපවත්නා නීති යටතේ වූ හෝ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීමට හෝ ඉටු කිරීමට ;

(ii) නීතිපතිවරයා, සොලිසිටර් ජනරාල්වරයා හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ යම් නීති නිලධරයකු හෝ නීතිපතිවරයා ගෙන් ලත් විශේෂ බලයක් යටතේ ක්‍රියා කරන යම් නීතිඥවරයකු හෝ ඇතුළුව, රජය යම් රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක් හෝ සමාන වෙනත් ආයතනයක් වෙනුවෙන් නීති උපදේශකයකු වශයෙන් ක්‍රියා කරන හෝ රජය, යම් රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ සමාන වෙනත් ආයතනයක් වෙනුවෙන් යම් නඩු කටයුත්තක දී පෙනී සිටින නීතිඥවරයකුගේ යම් තීරණයකට, නිර්දේශ කිරීමකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ;

(iii) මහජන සාමය පවත්වාගෙන යාම භාර සන්නද්ධ හමුදාවල, පොලිස් හමුදාවේ හෝ වෙනත් හමුදාවල සාමාජිකයකුව සිටින හෝ සිටි යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ කරුණ—

(අ) ඔහුගේ සේවා නියමයන්ට හා කොන්දේසිවලට ; හෝ

(ආ) ඒ සාමාජිකයා වශයෙන් තමාගේ තත්ත්වයෙහි ලා තමාට දෙන ලද යම් නියමයකට, අණකට, තීරණයකට හෝ දණ්ඩනයකට හෝ දඬුවමකට

අදාළ වන තාක් දුරට මහජන සාමය පවත්වාගෙන යාම භාර සන්නද්ධ හමුදාවල, පොලිස් හමුදාවේ හෝ වෙනත් හමුදාවල සාමාජිකයකුව සිටින හෝ සිටි යම් තැනැත්තකුට ;

(iv) සිවිල් හෝ අපරාධ නඩු කටයුතු පැවරීමට හෝ ඒවා පවත්වාගෙන යාමට සහ ඒවා සඳහා දෙනු ලබන තීරණයකට හෝ නිර්දේශයකට ;

(v) රජයේ නිලධරයන් පත් කිරීමට, මාරු කිරීමට, සේවයෙන් පහ කිරීමට හෝ රජයේ නිලධරයන් පිළිබඳ විනය පාලනයට ;

(vi) විගණකාධිපතිවරයාගේ යම් තීරණයකට, නිර්දේශයකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ;

(vii) මැතිවරණ කොමසාරිස්වරයාගේ යම් තීරණයකට, නිර්දේශයකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට ; හෝ

(viii) ඔම්බුඩ්ස්මන්වරයාගේ හෝ යම් නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයකුගේ යම් තීරණයකට, නිශ්චය කිරීමකට, නිර්දේශයකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට

අදාළ, මූලික අයිතියක් කඩකිරීමක් නොවන, අයුක්තියක් පිළිබඳ යම් චෝදනාවක්.

12. (1) මේ පනත යටතේ පරීක්ෂණයක් පවත්වනු ලබන අතරතුර දී— ඇතැම් ප්‍රශ්න ශ්‍රේෂ්ඨාධිකරණය වෙත යොමු කිරීම.

(අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අර්ථ නිරූපණය කිරීමකට අදාළව ; හෝ

(ආ) යම් විශේෂිත කරුණු සම්බන්ධයෙහි ලා රජයේ නිලධරයකු විසින් හෝ රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක, හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයකු විසින් හෝ මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් කරනු ලැබ තිබේද, නැතහොත් මූලික අයිතිවාසිකමක් කඩ කිරීමක් කරනු ලැබීමට ඉඩ තිබේද යනුවෙන්

සුවිශේෂයෙන් පොදුවේ වැදගත් වන යම් නීති ප්‍රශ්ණයක් උද්ගත වුවහොත්, ඒ ප්‍රශ්නය පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය ලබා ගැනීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා විසින් කාරණයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) නීති ප්‍රශ්නය උද්ගත වන්නේ යම් සිද්ධි මත ද ඒ සිද්ධි පිළිබඳ ප්‍රකාශයක්, ඉදිරිපත් කරන ලද කාරණයෙහි අඩංගු විය යුතු අතර, ඒ සිද්ධි ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ මේ වගන්තිය යටතේ නඩු කටයුතුවලදී ප්‍රශ්න කරනු ලැබීමට යටත් නොවිය යුතු ය.

(3) නීතිපතිවරයාට හා, පැමිණිලිකරුවකු සිටී නම්, පැමිණිලිකරුට, ඉදිරිපත් කරන ලද එවැනි යම් කාරණයක් පිළිබඳ දැන්වීමක් භාරදෙනු ලැබිය යුතු අතර එවැනි යම් කාරණයක් විභාග කරනු ලබන අවස්ථාවක දී කරුණු ඉදිරිපත් කිරීමට හිමිකම ඔවුන්ට තිබිය යුතු ය.

(4) එවැනි විභාග කිරීමක දී ඔම්බුඩ්ස්මන්වරයා විසින් නීතිඥවරයකු මගින් කරුණු ඉදිරිපත් කිරීම කරනු ලැබිය යුතු ය.

13. (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, මෙම පනත යටතේ තමා ආරම්භ කළ පරීක්ෂණයක්— ඇතැම් අවස්ථාවල දී ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කිරීම නතර කර දැමිය හැකි බව.

(අ) පරීක්ෂණයට භාජනව ඇති කරුණ සම්බන්ධයෙන් පැමිණිලිකරුට හෝ අනාජ්තියට පත් තැනැත්තාට, නීතිය යටතේ හෝ පවත්නා පරිපාලන ව්‍යවහාරය යටතේ හෝ, සාධාරණ වන්නා වූ හෝ ආධාර පැතීම සාධාරණ වීමට ඉඩ තිබුණු හෝ ප්‍රමාණවත් පිළියමක් නැතහොත් අභියාචනය කිරීමේ අයිතියක් තිබෙන බව හෝ තිබුණු බව ; හෝ

(ආ) පැමිණිල්ලෙහි හෝ චෝදනාවෙහි විෂය කරුණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් වැදගත්කමක් පැමිණිලිකරුට නොමැති බව ; හෝ

(ඇ) පැමිණිල්ල හෝ චෝදනාව ඉදිරිපත් කිරීම පැමිණිලිකරුගේ වරදින් තොසැහෙන ලෙස ප්‍රමාද වී තිබෙන බව ; හෝ

(ඈ) යම් ජාත්‍යන්තර සංවිධානයක් හෝ නියෝජ්‍ය ආයතනයක් සමග ශ්‍රී ලංකාවෙහි සම්බන්ධතාවත් ඇතුළුව ශ්‍රී ලංකාවේ සුරක්ෂිත භාවයට, ආරක්ෂාවට හෝ ජාත්‍යන්තර සම්බන්ධතාවලට ඒ පරීක්ෂණය හානි කර විය හැකි බව ; හෝ

(ඉ) යම් බන්ධනාගාරයක හෝ රඳවා තබන ස්ථානයක විනය හෝ සාමය පවත්වාගෙන යාමට ඒ පරීක්ෂණය හානි කර විය හැකි බව

ඔහු අදහස් කරන්නේ නම්, තව දුරටත් පවත්වාගෙන යාම නතර කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය මගින් තමා වෙත සතු කර දී ඇති අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී ඔම්බුඩ්ස්මන්වරයා පරීක්ෂණයක් නතර කරනු ලබන අවස්ථාවක, ඒ පරීක්ෂණය නතර කිරීමට තමා ගන්නා ලද තීරණය, ඒ සඳහා හේතු සහිතව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත ඔහු විසින් දන්වනු ලැබිය යුතු ය.

පරීක්ෂණයක් පැවැත්වීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කරනු නො ලැබිය හැකි බව.

**14.** යම් කරුණක් 11 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ඔම්බුඩ්ස්මන්වරයාගේ බලසීමාව ඇතුළත නොගැනෙන හේතුව මත ඒ කරුණ, අවස්ථාවෝචිත පරිදි, පරීක්ෂා කිරීම හෝ වැඩිදුරටත් පරීක්ෂා කිරීම හෝ ඔම්බුඩ්ස්මන්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබීම හෝ 13 වන වගන්තිය යටතේ තම අභිමතය ක්‍රියාත්මක කිරීමේ දී ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂණයක් නතර කරනු ලැබීම හෝ අවසානාත්මක වන අතර, යම් අධිකරණයක දී හෝ විනිශ්චයාධිකාරයක දී හෝ ප්‍රශ්න කිරීම හෝ සර්ටියෝරාරි, තහනම්, මැන්ඩාමුස්, ප්‍රෙසිඩෙන්ඩෝ වැනි රිට් ආඥා ස්වරූපයේ ආඥා සඳහා වූ නඩු කටයුතුවල දී හෝ අන්‍යාකාරයකින් හෝ සමාලෝචනය කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂණ පවත්වාගෙන යාම.

**15.** (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, මේ පනත යටතේ යම් කරුණක් පරීක්ෂා කිරීමට පෙර, ඒ පරීක්ෂණය පැවැත්වීමට තමා අදහස් කරන බව අදාළ ආයතනයේ ප්‍රධානයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් කරනු ලබන සෑම පරීක්ෂණයක් ම ප්‍රසිද්ධියෙන් තොරව පවත්වනු ලැබිය යුතු අතර, කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් වශයෙන් ඒ පරීක්ෂණයේ දී පෙනී සිටීමට හිමිකමක් නො තිබිය යුතු ය.

(3) ඔම්බුඩ්ස්මන්වරයා විසින් අවශ්‍ය යයි තමා සලකන සියලු විමසීම් කරනු ලැබිය යුතු නමුත් කවර වූ හෝ විභාගයක් කිරීමට ඔහු බැඳී නොසිටින්නේ ය. ඔහු සුදුසු යයි සලකන තැනැත්තන්ගේ සාක්ෂි ඇසීම හෝ ඔහු සුදුසු යයි සලකන තැනැත්තන්ගෙන් තොරතුරු ලබා ගැනීම හෝ කරුණු ඉදිරිපත් කිරීම් භාර ගැනීම හෝ ඔහු විසින් කරනු ලැබිය හැකි ය. (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකුට අයිතිවාසිකමක් වශයෙන් ඔම්බුඩ්ස්මන්වරයා වෙත සාක්ෂි දීමට හෝ කරුණු ඉදිරිපත් කිරීමට හෝ හිමිකමක් නො තිබිය යුතු ය.

(4) (අ) ඔම්බුඩ්ස්මන්වරයා විසින් යම් තැනැත්තකුට විරුද්ධ කිසියම් වාර්තාවක් හෝ නිර්දේශයක් කිරීම, ඒ විරුද්ධ වාර්තාව හෝ නිර්දේශය අදාළ වන කරුණ සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට අවස්ථාවක් ඒ තැනැත්තාට ඔම්බුඩ්ස්මන්වරයා විසින් ස්වකීය පරීක්ෂණයේ දී දෙනු ලැබ තිබුණේ නම් මිස, නො කරනු ලැබිය යුතු ය.

(ආ) කිසිම පරීක්ෂණයක දී කිසිම තැනැත්තකු වෙනත් යම් තැනැත්තකු විසින් නියෝජනය නො කරනු ලැබිය යුතු ය.

(ඇ) අදාළ ආයතනයේ ප්‍රධානයාට ඔම්බුඩ්ස්මන්වරයා වෙත වාචිකව හෝ ලිඛිතව කරුණු ඉදිරිපත් කිරීමට හිමිකම තිබිය යුතු ය.

(ඈ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, ඔම්බුඩ්ස්මන්වරයා විසින් තමා සුදුසු යයි සලකන ආකාරයට තමාගේ කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

**16.** (1) ඔම්බුඩ්ස්මන්වරයාට යම් පරීක්ෂණයක කාර්ය සඳහා— සාක්ෂි.

(අ) තමා විසින් ලබා ගැනීමට සහ භාර ගැනීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි සලකනු ලබන සියලු ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට සහ භාර ගැනීමට සහ තමා විසින් සාක්ෂිකරුවන් වශයෙන් විභාග කිරීමට අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි සලකනු ලබන සියලු තැනැත්තන් සාක්ෂිකරුවන් වශයෙන් විභාග කිරීමට ;

(ආ) යම් සාක්ෂිකරුවකු අධිකරණයේ දී සාක්ෂි දෙමින් සිටියේ නම් ඔහු විසින් කිරීමට නියමිතව තිබුණ ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම මත යම් සාක්ෂිකරුවකුගේ ලිඛිත හෝ වාචික සාක්ෂි දීම, නියම කිරීමට සහ ඒ සෑම සාක්ෂිකරුවකු ම ලවා ප්‍රතිඥාවක් දෙනු ලැබීමට හෝ දිවුරුමක් කරනු ලැබීමට සැලැස්වීමට ;

(ඇ) යම් තැනැත්තකු, සාක්ෂි දීමට හෝ ඔහු සන්තකයෙහි හෝ ඔහුගේ පාලනය යටතේ තිබෙන්නා වූ යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමට හෝ කැඳවීමට සහ සාක්ෂිකරුවකු වශයෙන් ඔහු විභාග කිරීමට හෝ ඔහගේ සන්තකයෙහි හෝ ඔහුගේ පාලනය යටතේ ඇති යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කරන ලෙස ඔහට නියම කිරීමට ;

(ඈ) බන්ධනාගාරයක්, නිරීක්ෂණ නිවාසයක්, මානසික රෝහලක් නැතහොත් රඳවා තැබීමේ වෙනත් ස්ථානයක් භාරව සිටින යම් තැනැත්තකුට, ඔහුගේ අත්අඩංගුවෙහි හෝ භාරයෙහි සිටින යම් තැනැත්තකු විභාග කරනු ලැබීමේ කාර්යය සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කරන ලෙස හෝ ඒ තැනැත්තාගේ සන්තකයෙහි හෝ පාලනය යටතේ තිබෙන්නා වූ යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් හෝ ඉදිරිපත් කරන ලෙස හෝ විධාන කිරීමට ; සහ

(ඉ) සාක්ෂි ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලින් කිසිවක් නොතකා මෙන්ම මෙහි මින් මතු සලසා ඇති විධිවිධානවලට යටත්ව ද, ඔම්බුඩ්ස්මන්වරයාගේ මතයට අනුව පරීක්ෂණයේ දී සහාය විය හැකි යම් ලිඛිත හෝ වාචික හෝ සාක්ෂි ආවේශ්‍ය කිරීමට

බලය තිබිය යුතු ය.

(2) සාක්ෂිකරුවකු පිළිබඳ ඒ සෑම විභාගයක් ම දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදයේ කාර්ය සඳහා අධිකරණ නඩු කටයුත්තක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) යම් කරුණක් සම්බන්ධයෙන් රහස්‍යතාව පවත්වා ගැනීමට හෝ යම් කරුණක් හෙළිදරව් කිරීමෙන් වැළකී සිටීමට හෝ යම් විශේෂ නීතියක විධිවිධාන මගින් බැඳී සිටින යම් තැනැත්තකු විසින් ඒ කරුණ පිළිබඳව සාක්ෂි දීමෙන් හෝ තොරතුරු සැපයීමෙන් හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීමෙන් හෝ යම් ලියවිල්ලක් නැතහොත් වෙනත් දෙයක් ඉදිරිපත් කිරීමෙන් හෝ ඒ රහස්‍යතාව හෝ හෙළිදරව් නොකිරීම පිළිබඳ ඒ බැඳීම නමා කඩකරමින් ක්‍රියා කරන්නේ නම් ඒ තැනැත්තා විසින් ඒ කරුණ සම්බන්ධයෙන් සාක්ෂි දීම හෝ තොරතුරු සැපයීම හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම හෝ ලියවිල්ලක් නැතහොත් වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එවැනි යම් තැනැත්තකු වෙත පැමිණිලිකරු හෝ අතෘප්තියට පත් තැනැත්තා හෝ වෙනත් යම් තැනැත්තකු විසින් පැමිණිලිකරුට පමණක් අදාළව හෝ අතෘප්තියට පත් තැනැත්තාට පමණක් අදාළව හෝ කරන ලද යම් ප්‍රකාශයක් සම්බන්ධයෙන් සාක්ෂි දෙන ලෙස හෝ තොරතුරු සපයන ලෙස හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරු දෙන ලෙස හෝ එවැනි යම් තැනැත්තකු වෙත සපයන ලද යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් හෝ ඉදිරිපත් කරන ලෙස හෝ, ඔම්බුඩ්ස්මන්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම, ඒ බැඳීම නොතකා ද පැමිණිලිකරුගේ හෝ අතෘප්තියට පත් තැනැත්තාගේ හෝ ඒ වෙනත් තැනැත්තාගේ හෝ කලින් ලබා ගත් කැමැත්ත ඇතිව ද කරනු ලැබිය හැකි ය.

## 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු 11 කොමසාරිස් පනත

(4) (අ) කවර වූ හෝ තැනැත්තකු විසින්, අවස්ථාවෝචිත පරිදි, යම් සාක්ෂියක් දීම හෝ තොරතුරක් සැපයීම හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරුදීම හෝ යම් ලියවිල්ලක් නැතහොත් වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම නිසා—

(i) ශ්‍රී ලංකාවේ සුරක්ෂිතභාවයට, ආරක්ෂාවට හෝ (යම් ජාත්‍යන්තර සංවිධානයක් නැතහොත් නියෝජ්‍ය ආයතනයක් සමග ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතා ඇතුලුව) ජාත්‍යන්තර සම්බන්ධතාවලට හානිකර වන බව හෝ හානිකර වීමට ඉඩ ඇති බව;

(ii) අමාත්‍ය මණ්ඩලයේ හෝ අමාත්‍ය මණ්ඩලයේ යම් කාරක සභාවක, හෝ රහස් හෝ රහස්‍ය ස්වභාවයේ හෝ කරුණු වලට අදාළ සාකච්ඡා නැතහොත් කටයුතු හෙළිදරව් කිරීමක් සිදු වන බව හෝ සිදුවීමට ඉඩ ඇති බව;

(iii) වැරදි පරීක්ෂා කිරීම හෝ සොයා ගැනීම කෙරෙහි බාධා වන බව හෝ බාධා වීමට ඉඩ ඇති බව හෝ අවහිර වන බව හෝ අවහිරවීමට ඉඩ ඇති බව; හෝ

(iv) රාජ්‍ය රහස්‍යතා පනතේ විධිවිධාන කඩ වන හෝ කඩ වීමට ඉඩ ඇති බව

නීතිපතිවරයා විසින් සහතික කරනු ලැබුවහොත් ඒ තැනැත්තා විසින් ඒ සාක්ෂි දීම හෝ ඒ තොරතුරු සැපයීම හෝ ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම නැතහොත් ඒ ලියවිල්ල හෝ වෙනත් දෙය ඉදිරිපත් කිරීම හෝ නො කරනු ලැබිය යුතු ය.

(ආ) මේ පනතේ විධිවිධානවලට යටත් ව, යම් ලියවිල්ලක් හෙළිදරව් කිරීම හෝ යම් සාක්ෂියක් දීම හෝ තොරතුරක් සැපයීම හෝ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම පොදු සුබ සිද්ධියට හානිකර වෙතැයි යන හේතුව මත ඒ ලියවිල්ල අනාවරණය නොකර සිටීමට බලය දෙන හෝ අනාවරණය නොකළ යුතු බවට නියම කරන හෝ ඒ සාක්ෂිය දීම හෝ තොරතුරු සැපයීම හෝ ඒ ප්‍රශ්නයට පිළිතුරු දීම ප්‍රතික්ෂේප කිරීමට, බලය දෙන හෝ ප්‍රතික්ෂේප කළ යුතු බවට නියම කරන යම් නෛතික රීතියක්, ඔම්බුඩ්ස්මන්වරයා විසින් කරනු ලබන යම් පරීක්ෂණයකට අදාළ නොවිය යුතු ය.

(5) (3) වන සහ (4) වන උපවගන්තිවල අන්‍යාකාරයකින් විධිවිධාන සලසා ඇති පරිදි හැර, සාක්ෂි දීම හෝ තොරතුරු සැපයීම, ප්‍රශ්නවලට පිළිතුරුදීම සහ ලියවිලි සහ වෙනත් දේ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සෑම තැනැත්තකුට ම, ඒ තැනැත්තා අධිකරණයක දී සාක්ෂි දෙන්නා වූ සාක්ෂිකරුවකු වී නම් එවිට ඔහු හිමිකම් ලබන වරප්‍රසාද හා පරිහාර ම තිබිය යුතු ය.

(6) (අ) ඔම්බුඩ්ස්මන්වරයා වෙත හෝ ඔහු ඉදිරියේ හෝ දෙන ලද යම් සාක්ෂියක්, තොරතුරක්, පිළිතුරක් හෝ ඉදිරිපත් කරන ලද යම් ලියවිල්ලක් නැතහොත් වෙනත් දෙයක් සම්බන්ධයෙන් කිසිම තැනැත්තකු යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක යම් සිවිල් හෝ අපරාධ නඩුවකට හෝ වෙනත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තකට හෝ යටත් නොවිය යුතු ය.

(ආ) ඔම්බුඩ්ස්මන්වරයා වෙත හෝ ඔහු ඉදිරියේ යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ දෙන ලද පිළිතුරක් හෝ පිළිබඳ කිසිම සාක්ෂියක් යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක සිවිල් හෝ අපරාධ නඩුවක දී නැතහොත් වෙනත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තාට හෝ වෙනත් යම් තැනැත්තකුට විරුද්ධව සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොකරනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත යටතේ වූ පරීක්ෂණයක් පැවැත්වෙන අතර තුර දී හෝ පරීක්ෂණයක කාර්ය සඳහා හෝ ඔම්බුඩ්ස්මන්වරයා වෙත හෝ ඔහුගේ නිලධරයන් වෙත හෝ ඔම්බුඩ්ස්මන්වරයා විසින් හෝ ඔහුගේ නිලධරයන් විසින් හෝ යවනු ලැබුවා වූ ද පරීක්ෂණයක කාර්ය සඳහා විශේෂයෙන් ම පිළියෙල කරනු ලැබුවා වූ ද යම් ලේඛනයක් පිළිබඳ කිසිම සාක්ෂියක් යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී සාක්ෂි වශයෙන් ආවේශ්‍ය නොකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන කිසිවක් මගින්—

(i) මේ වගන්තියේ (2) වන උපවගන්තිය සමග කියවිය යුතු දණ්ඩ නීති සංග්‍රහයේ XI වන පරිච්ඡේදය යටතේ වූ යම් වරදක් සඳහා වූ හෝ 20 වන වගන්තිය යටතේ වූ යම් වරදක් සඳහා වූ හෝ මේ පනත යටතේ රහස්‍යතාව රැකීමට නැතහොත් කරුණු හෙළිදරව් නොකිරීමට ඔහුගේ ඇති බැඳීම කඩකිරීම සඳහා වූ හෝ සිවිල් නඩුවට, අපරාධ නඩුවට හෝ දණ්ඩනයට හෝ යම් තැනැත්තකු බැඳීමට යටත්ව සිටීම හීන කිරීමක් හෝ එය කෙරෙහි බලපෑමක් හෝ නොකරනු ලැබිය යුතු අතර, මේ උපවගන්තියේ ඉහත දැක්වෙන විධිවිධාන කිසිවකින් ඒ බැඳීමට යටත්ව සිටීම, හීන කරනැයි හෝ එය කෙරෙහි බලපෑමක් ඇති කෙරෙනැයි හෝ නො සලකනු ලැබිය යුතු හෝ තේරුම් නොගනු ලැබිය යුතු වේ; නැතහොත්

(ii) එවැනි යම් සිවිල් නඩුවක හෝ අපරාධ නඩුවක හෝ කාර්යය සඳහා යම් තැනැත්තකුගේ සාක්ෂියේ හෝ සාක්ෂියේ යම් කොටසක හෝ ස්වභාවය ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම තහනම් කිරීමක් නොකරනු ලැබිය යුතු අතර, ඒ ප්‍රසිද්ධ කිරීම හෝ හෙළිදරව් කිරීම, තහනම් කෙරෙනැයි නොසලකනු ලැබිය යුතු හෝ තේරුම් ගැනීමක් නොකරනු ලැබිය යුතු හෝ වේ.

**ඔම්බුඩ්ස්මන්වරයාගේ තීරණය කිරීම.**

**17.** (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, තමාගේ පරීක්ෂණය අවසන් කළ විට, පරීක්ෂණයේ විෂය කරුණ වූ යම් තීන්දුවක්, නිර්දේශයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක්—

(i) නීතියට පටහැණි වූයේ ද;

(ii) සිද්ධිය පිළිබඳව හෝ නීතිය පිළිබඳව වූ වැරදීමක් මත සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් පදනම් වූයේ ද;

(iii) අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී නැතහොත් නොමනා වෙනස්කම් දක්වන්නක් වූයේ ද නැතහොත් අන්‍යාකාරයකින් සාවද්‍ය වූයේ ද ;

(iv) අසාධාරණ, අයුක්ති සහගත, පීඩාකාරී නැතහොත් නොමනා වෙනස්කම් දක්වන හෝ අසාධාරණ විය හැකි, අයුක්ති සහගත විය හැකි පීඩාකාරී විය හැකි නැතහොත් නොමනා වෙනස්කම් දක්විය හැකි ව්‍යවහාරයක් අනුව වූවක් ද ;

(v) (අ) නොමනා කාර්යයක් සඳහා හෝ අදාළ නොවන හේතු මත හෝ අදාළ නොවන කරුණු සැලකිල්ලට ගෙන හෝ වැදගත් කරුණු සැලකිල්ලට ගැනීම පැහැර හරිමින් හෝ ක්‍රියාත්මක කරනු ලැබ ඇති අභිමතයක් අනුව කරන ලද්දේ ද ; නැතහොත්

(ආ) අභිමතයක් ක්‍රියාත්මක කිරීමේ දී, ඔම්බුඩ්ස්මන්වරයාගේ මතයට අනුව, හේතු දක්විය යුතුව තිබියදීත්, හේතු නොදක්වමින් කරන ලද්දේ ද ; හෝ

(vi) අසාධාරණ ලෙස ප්‍රමාද වූයේ ද

යන ප්‍රශ්නය ඇතුළුව මූලික අයිතිවාසිකමක් යම් ලෙසකින් කඩ කරනු ලැබ තිබේ ද නැතහොත් කඩකරනු ලැබීමට ඉඩ තිබේ ද නැතහොත් වෙනත් යම් අයුක්තියක් සිදුවී තිබේ ද නැතහොත් සිදුවීමට ඉඩ තිබේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය ; තව ද ඔහු විසින් තමාගේ නිශ්චය කිරීම, ඒ පිළිබඳ තමාගේ හේතු සහිතව, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කළ යුතු අතර, ඔහු විසින්—

(i) කරුණ නැවත සලකා බලන ලෙස ;

(ii) නොකර හැරීම නිවැරදි කරන ලෙස ;

(iii) තීරණය අවලංගු කරන ලෙස හෝ වෙනස් කරන ලෙස ;

(iv) ඒ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම පදනම් වූයේ යම් ව්‍යවහාරයක් මත ද ඒ ව්‍යවහාරය වෙනස් කරන ලෙස ;

(v) ඒ තීරණය, නිර්දේශය, ක්‍රියාව හෝ නොකර හැරීම පිළිබඳව හේතු දැක්විය යුතු යයි

නිර්දේශ කරනු ලැබිය හැකි ය.

(2) මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව විසින්, (1) වන උප වගන්තිය යටතේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් තමන් වෙත කරන ලද වාර්තාවක් සලකා බැලීමෙන් අනතුරුව, ඔම්බුඩ්ස්මන්වරයාගේ වාර්තාව පිළිබඳව ගතයුතු ක්‍රියා මාර්ගය සම්බන්ධයෙන් ස්වකීය මතය පාර්ලිමේන්තුව වෙත වාර්තා කරනු ලැබිය හැකි ය.

## IV වන කොටස
## පොදු විධිවිධාන

18. ඔම්බුඩ්ස්මන්වරයා විසින් යටත් පිරිසෙයින් සෑම ලිත් වර්ෂයක දී එක් වරක්වත්, මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා හා කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා ගෙවී ගිය ලිත් වර්ෂය තුළ දී කරන ලද වැඩ කටයුතු පිළිබඳ වාර්තාවක් ජනාධිපතිවරයා වෙත සහ පාර්ලිමේන්තුව වෙත යවනු ලැබිය යුතු ය.

ඔම්බුඩ්ස්මන්වරයාගේ වාර්ෂික වාර්තාව.

ස්ථානයකට ඇතුළුවීමේ බලතල.

**19.** (1) ඔම්බුඩ්ස්මන්වරයා විසින්, මේ පනතේ කාර්ය සඳහා, යම් රජයේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක්, පළාත් පාලන ආයතනයක් හෝ වෙනත් සමාන ආයතනයක් විසින් පාවිච්චි කරනු ලබන හෝ පදිංචිව සිටින යම් නිවාසස්ථානයකට හෝ ස්ථානයකට හෝ දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ කවර වූ හෝ අවස්ථාවක සාධාරණ වේලාවක දී ඇතුල් වීම ද ඒ නිවාසස්ථානය හෝ ස්ථානය සහ තත්කාලයෙහි එය ඇතුළත හෝ මත තිබෙන යම් දෙයක් පරීක්ෂා කිරීම ද, 15 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඔහුගේ බලසීමාව ඇතුළත ගැනෙන යම් පරීක්ෂණයක් එහිදී පැවැත්වීම ද කරනු ලැබිය හැකි ය.

(2) ඔම්බුඩ්ස්මන්වරයා විසින් එවැනි භූමියකට නැතහොත් ස්ථානයකට ඇතුළුවීමට පෙර අදාළ ආයතනයේ ප්‍රධානයා වෙත දැනුම්දීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ කිසිවකින් රාජ්‍ය රහස්‍යතා පනතේ අර්ථානුකූලව තහනම් කරන ලද ස්ථානයක් වන යම් නිවාසස්ථානයකට හෝ ස්ථානයකට, නෞකාවකට හෝ ගුවන් යානයකට ඇතුළු වීමට, ඔම්බුඩ්ස්මන්වරයාට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ බලයක් නොලැබෙන්නේ ය.

වැරදි.

**20.** (1) (i) මේ පනත යටතේ භාර දෙන ලද සිතාසියක සඳහන් කර ඇති ස්ථානයෙහි දී සහ වේලාවේ දී ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරියෙහි පෙනී සිටීම, සාධාරණ හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ;

(ii) ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කරනු ලබමින් තිබෙන කරුණුවලට අදාළව, දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම හෝ කරවනු ලැබීම ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ යථා පරිදි දිවුරුම් දීම හෝ ප්‍රතිඥා දීම හෝ කරවනු ලැබීමෙන් පසුව තමා ගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම, සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ පැහැර හරින්නා වූ;

(iii) තම සන්තකයේ හෝ පාලනය යටතේ තිබෙන්නා වූ ද පරීක්ෂණයේ කාර්ය සඳහා ඉදිරිපත් කරන ලෙස තමාගෙන් ඉල්ලා සිටිනු ලැබ තිබුණා වූ ද යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, සාධාරණ හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කරන්නා වූ හෝ පැහැර හරින්නා වූ;

(iv) මේ පනත යටතේ වූ පරීක්ෂණයක කාර්ය සඳහා ඔම්බුඩ්ස්මන්වරයා වෙත හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයෙහි යම් වෙනත් නිලධරයකු වෙත හෝ ඕනෑකමින් ම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන්නාවූ;

(v) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයාගේ හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයෙහි යම් වෙනත් නිලධර යකුගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී හෝ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේදී හෝ ඔම්බුඩ්ස්මන්වර යාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් නිලධරයකුට හෝ, සාධාරණ හේතුවක් නොමැතිව අවහිරකරන්නාවූ ;

(vi) මේ පනත යටතේ රහස්‍යතාව පවත්වා ගැනීමේ කාර්ය කඩවන ලෙස ක්‍රියා කරන්නා වූ ;

(vii) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් යම් පරීක්ෂණයක් කරනු ලබමින් සිටින හෝ විමසී මක් පවත්වනු ලබමින් සිටින හෝ අතරතුර දී ඔම්බුඩ්ස්මන්වරයාට චේතනාන්විතව යම් අපහාස යක් කරන්නා වූ නැතහොත් යම් බාධාවක් පමුණුවන්නා වූ ; හෝ

(viii) ප්‍රකාශ කරනු ලබන හෝ කියවනු ලැබීමට අදහස් කරනු ලබන හෝ වචන මගින් ඔම්බුඩ්ස්මන් වරයා අපකීර්තියට පත් කිරීමට අදහස් කරනු ලබන යම් ප්‍රකාශයක් කරන්නා වූ හෝ ප්‍රසිද්ධ කරන්නා වූ හෝ එවැනි වෙනත් ක්‍රියාවක් කරන්නා වූ

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබූ විට එක් අවුරුද්දකට වැඩි නොවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහස කට වැඩි නොවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ ඒ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (i) වන ඡේදයෙහි හෝ (ii) වන ඡේදයෙහි හෝ (iii) වන ඡේදයෙහි හෝ (v) වන ඡේදයෙහි සඳහන් වරදක් සඳහා වූ අපරාධ නඩුවක දී යම් තැනැත්තකු විසින් තමා වෙත භාර දෙන ලද සිතාසියක සඳහන් කර ඇති වේලාවේදී හා ස්ථානයෙහි දී ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරියේ පෙනී සිටීම, සාධාරණ හේතුවක් නොමැතිව, පැහැර හැර ඇති බවට නැතහොත්, ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කරනු ලබමින් තිබෙන කරුණු වලට අදාළව තමාගෙන් අසනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම, සාධාරණ හේතුවක් නොමැතිව, පැහැර හැර ඇති බවට හෝ ප්‍රතික්ෂේප කර ඇති බවට නැතහොත් තම සන්තකයේ හෝ පාලනය යටතේ තිබෙන්නා වූ ද ඔම්බුඩ්ස්මන්වරයා විසින් කරනු ලබන පරීක්ෂණයේ කාර්ය සඳහා ඉදිරිපත් කරන ලෙස තමාට නියම කරනු ලැබ තිබෙන්නා වූ ද යම් ලියවිල්ලක් හෝ වෙනත් දෙයක් ඔම්බුඩ්ස්මන්වරයා වෙත ඉදිරිපත් කිරීම සහ පෙන්වීම, සාධාරණ වූ හේතුවක් නොමැතිව, ප්‍රතික්ෂේප කර ඇති බවට හෝ පැහැර හැර ඇති බවට නැතහොත් මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයාට හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයෙහි

වෙනත් යම් නිලධරයකුට හෝ සේවකයකුට හෝ ඔහුගේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඔහුගේ කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ සාධාරණ හේතුවක් නොමැතිව, බාධා පමුණුවා ඇති බවට හෝ ඔම්බුඩ්ස්මන්වරයාගේ අත්සනින් යුත් සහතිකයක් එහි අඩංගු කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂි වශයෙන් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තියෙහි සහ 21 වන වගන්තියෙහි " ඔම්බුඩ්ස්මන්වරයා " යන යෙදුමට නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙක් ද ඇතුළත් වේ.

**සිවිල් හෝ අපරාධ නඩු පැවරීමෙන් ආරක්ෂාව.**

**21.** (1) මේ පනත යටතේ ඔම්බුඩ්ස්මන්වරයා විසින් හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් නිලධරයකු විසින් හෝ සද්භාවයෙන් කරනු ලබන නැතහොත් කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයාට හෝ එවැනි යම් නිලධරයකුට හෝ විරුද්ධව කවර වූ හෝ සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) ඔම්බුඩ්ස්මන්වරයා විසින් මේ පනත යටතේ කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් හෝ වෙනත් යම් තැනැත්තකු විසින් ඒ වාර්තාවේ සාරානුකූලව සත්‍ය වූ විස්තරයක් පළකිරීම සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව හෝ කවර වූ හෝ අධිකරණයක දී හෝ අධිකරණමය ස්වභාවයක් දරන යම් නඩු කටයුත්තක දී හෝ සාක්ෂි දීම සඳහා ඔම්බුඩ්ස්මන්වරයා හෝ ඔහුගේ කාර්ය මණ්ඩලයේ යම් නිලධරයකු හෝ කැඳවනු නොලැබිය යුතු ය.

(3) ඔම්බුඩ්ස්මන්වරයා විසින් මේ පනත යටතේ කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් ඔම්බුඩ්ස්මන්වරයාට විරුද්ධව නැතහොත් වෙනත් යම් තැනැත්තකු විසින් ඒ වාර්තාවෙහි සාරානුකූලව සත්‍ය වූ විස්තරයක් පළ කිරීම සම්බන්ධයෙන් ඒ, තැනැත්තාට විරුද්ධව හෝ සිවිල් හෝ අපරාධ නඩුවක් නැත හොත් වෙනත් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් හෝ යම් අධිකරණයක හෝ විනිශ්චයාධිකාරයක හෝ පවරනු නොලැබිය යුතු ය.

**රීති.**

**22.** (1) අමාත්‍යවරයා විසින්, ඔම්බුඩ්ස්මන්වරයා විමසා, ඔම්බුඩ්ස්මන්වරයා ඉදිරියේ පෙනී සිටින යම් සාක්ෂිකරුවකු විසින් සාධාරණ ලෙස දරන ලද ගමන් වියදම් සහ වෙනත් වියදම් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර එය ගැසට් පත්‍රයෙහි පළ කිරීමේ දින සිට හෝ ඒ රීතියේ සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පමණ ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ

අනුමත නොකරන ලද එවැනි යම් රීතියක් අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ රීතිය යටතේ කලින් කරන ලද කිසිවකට ඒ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකීම නිසා හානියක් නොවිය යුතු ය. රීතියක් එසේ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

23. 11 වන වගන්තියේ (අ) ඡේදයෙහි විධිවිධානවලට යටත්ව, මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයට පෙර සිදු වූයේ යයි කියනු ලබන මූලික අයිතියක් කඩ කිරීම හෝ වෙනත් අයුක්තියක් හෝ පිළිබඳ යම් පැමිණිල්ලක් හෝ චෝදනාවක් ඔම්බුඩ්ස්මන්වරයා විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

පනත ක්‍රියාත්මක වීමට පෙර සිදුවූ කරුණු පිළිබඳ පැමිණිලි.

24. මේ පනතේ විධිවිධාන වූ කලී, යම් තැනැත්තකුට යම් ප්‍රතිකර්මයක් හෝ අභියාචනය කිරීමේ අයිතියක් නැතහොත් විරෝධය පෑමේ අයිතියක් සලසා දෙනු ලබන්නේ හෝ යම් කරුණක් විමසීමකට ලක් කිරීම හෝ පරීක්ෂා කිරීම සඳහා යම් කාර්ය පටිපාටියක් සලසා දෙනු ලබන්නේ හෝ යම් වෙනත් ප්‍රඥප්තියක හෝ යම් නෛතික රීතියක හෝ යම් විධිවිධාන යටතේ ද ඒ විධිවිධානවලට අතිරේක විධිවිධාන වන අතර, මේ පනතෙහි කිසිවකින් ඉහත කී පරිදි එවැනි යම් ප්‍රතිකර්මයක් හෝ අභියාචනය කිරීමේ හෝ විරෝධය පෑමේ අයිතියක් හෝ කාර්ය පටිපාටියක් හෝ අපේක්ෂා කිරීම සීමා නොකරනු ලැබිය යුතු අතර, මේ පනතෙහි කිසිවක් ඒ අපේක්ෂා කිරීම කෙරෙහි බල නොපෑ යුතු ය.

ඉවහැරීම.

25. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

අර්ථ නිරූපණය.

"ආයතනයක ප්‍රධානයා" යන්නෙන්—

(අ) ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක සේවය කරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, එම දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා අදහස් වන අතර, ඒ රජයේ නිලධරයා දෙපාර්තමේන්තුවක ප්‍රධානයා වන අවස්ථාවක, එම දෙපාර්තමේන්තුව පවරා දී ඇත්තේ යම් අමාත්‍යාංශයකට ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

(ආ) අමාත්‍යාංශයක සේවය කරන රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වන අතර, ඒ රජයේ නිලධරයා ලේකම්වරයා වන අවස්ථාවක, ඒ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා අදහස් වේ;

(ඇ) උපලේඛනගත රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 112 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අධිකරණ සේවා කොමිෂන් සභාව අදහස් වේ;

(ඈ) වෙනත් යම් රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, එම රජයේ නිලධරයා සේවය කරමින් සිටින්නේ යම් ප්‍රධාන විධායක නිලධරයකුගේ සාමාන්‍ය විධානය සහ පාලනය යටතේ ද ඒ ප්‍රධාන විධායක නිලධරයා අදහස් වේ ;

(ඉ) රාජ්‍ය සංස්ථාවක, පළාත් පාලන ආයතනයක හෝ සමාන වෙනත් ආයතනයක නිලධරයකු සම්බන්ධයෙන් වූ විට, එම රාජ්‍ය සංස්ථාවේ, පළාත් පාලන ආයතනයේ හෝ ඒ සමාන වෙනත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා අදහස් වන අතර, ඒ නිලධරයා එම රාජ්‍ය සංස්ථාවේ, පළාත් පාලන ආයතනයේ හෝ ඒ සමාන වෙනත් ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා වන අවස්ථාවක, එම රාජ්‍ය සංස්ථාව, පළාත් පාලන ආයතනය හෝ ඒ සමාන වෙනත් ආයතනයක් කටයුතු කරන්නේ යම් අමාත්‍යාංශයක් යටතේ ද ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් සංවර්ධන සභාවක්, මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වන අතර ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරයක් ඊට ඇතුළත් වේ ;

"නිලධරයා" යන්නට, සේවා නියුක්තයෙක් හෝ සේවකයෙක් ඇතුළත් වේ ;

"ඔම්බුඩ්ස්මන්වරයා" යන්නට, නියෝජ්‍ය ඔම්බුඩ්ස්මන්වරයෙක් සහ ඔම්බුඩ්ස්මන්වරයා විසින් 8 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ කරන ලද යම් පැවරීමක් යටතේ ඔම්බුඩ්ස්මන්වරයාගේ යම් බලයක් ක්‍රියාත්මක කරන්නා වූ හෝ යම් කාර්යයක් හෝ කර්තව්‍යයක් ඉටු කරන්නා වූ, ඔම්බුඩ්ස්මන්වරයාගේ කාර්ය මණ්ඩලයේ, වෙනත් යම් නිලධරයෙක් ඇතුළත් වේ ;

"ජනාධිපතිවරයා" යන්නෙන්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, සමාගම් ආඥාපනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක් ; මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය තුළදී ඒවා ලබාගත හැකිය.